සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# පළමු වාර පරීක්ෂණය 2018

08 ශ්‍රේණිය **ඉතිහාසය** කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

## I කොටස

- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉරි මත ලියන්න.**

01 ශ්‍රී ලංකාවේ වර්ෂයේ එක් කාලයක් පමණක් ජලය ලැබෙන ප්‍රදේශය .......................................... කලාපය වේ.
(තෙත් / ශුෂ්ක / වියළි)

02 පැරණි ජනාවාස ව්‍යාප්තිය ශ්‍රී ලංකාවේ බහුලව සිදුවූයේ ................................................................ ආශ්‍රිතවය.
(කඳු හා නිම්න/ සාරවත් වෙරළ ප්‍රදේශ / සාරවත් තැනි බිම්)

03 පරාක්‍රම සමුද්‍රය ............................................................ පිහිටා ඇත.
(අනුරාධපුරයේ / පොළොන්නරුවේ / මාගම)

04 අනුරාධපුර ප්‍රදේශයේ පිහිටි ...................................... වැව දේවානම්පියතිස්ස රජුගේ නිර්මාණයකි.
(අභය / හුරුළු / තිසා)

05 අතීත වාරි ශිල්පීන් විශාල වැව් තැනීම නිසා ............................................... පාලනය කර ගැනීමට හැකි විණි.
(ජලය / ගංවතුර / කෘෂිකර්මය)

- **අංක 06 - 10 දක්වා ප්‍රශ්න වල දැක්වෙන ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියෙන් යොදන්න.**

06 රජරට ශිෂ්ටාචාරය බිඳ වැටුනේ ක්‍රි.ව. 1215 දී කාලිංග මාඝ ආක්‍රමණයත් සමගය. ( )

07 අතීතයේ ජල්ලුරවාපි ලෙස හැඳින්වූයේ නූතන මින්නේරිය වැව වේ. ( )

08 වැවක බැම්ම ඉදිකිරීමේ දී විවිධ වර්ග වල පස් තට්ටු යොදා ගෙන ඇත. ( )

09 වැව් බැම්ම සේදීයාම වැළැක්වීම සඳහා වැවක ඉදිකර ඇති නිර්මාණය රළපනාව වේ. ( )

10 කලා ඔය හරහා ඉදිකර ඇති තේක්කම් අමුණ ස්ථාවර වේල්ලක් සහිත පුරාණ අමුණකි. ( )

- **අංක 11 - 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.**

11 ආළිසාර ඇළ මින් කුමන රජුගේ නිර්මාණයක් ද?
(1) 1 අග්බෝ රජු (2) 1 පරාක්‍රමබාහු රජු (3) වසභ රජු (4) මහසෙන් රජු

12 ධාතුසේන රජු කලාවැවේ සිට තිසා වැවට ජලය ගෙනයාමට තැනූ ඇළ මින් කුමක්ද?
(1) ආළිසාර (2) ඇලහැර ඇළ (3) මිණිපේ ඇළ (4) යෝධ ඇළ

13 අතීතයේ ඉදිකළ පොකුණු අතර වැසි ජලය ක්‍රමානුකූලව බැහැර කිරීමට ඉදිකළ පොකුණක් පවතින්නේ මින් කවර ස්ථානයකද?
(1) රුවන්වැලි සෑය අසල (2) අභයගිරි දාගැබ අසල
(3) රන්මසු උයන (4) අම්පාර රජගල විහාර භූමියේ

14 පද්මස්වර නම් වූ උයන ඉදිකරවන ලද්දේ මින් කවර රජතුමකුගේ මූලිකත්වයෙන්ද?
(1) 1 අග්බෝ රජු (2) 1 පරාක්‍රමබාහු රජු (3) ගෝඨාභය රජු (4) කූටකණ්ණ තිස්ස රජු

15 මෙහි දැක්වෙන්නේ පැරණි රජවරු ඉතාමත් සැලසුම් සහගතව ඉදිකල ජල උද්‍යානයකි. එය මින් කවර ස්ථානයක්ද?




(1) මහමෙව්නාව
(2) රන්මසු උයන
(3) නන්දන උයන
(4) සීගිරි ජල උද්‍යානය

● අංක 16 - 20 දක්වා ප්‍රශ්න වලට නිවැරදි සම්බන්ධතාව සහිත රූප සටහන අක්ෂර සහිතව නම් කර දක්වන්න.



A



B



C



D



E

16 කෘත්‍රිම ජල මල් නිපදවීමේ තාක්ෂණය සහිත ස්ථානය. ..............................

17 ශක්තිමත් ගඩොල් නිෂ්පාදන තාක්ෂණය. ..............................

18 ලෝහ කර්මාන්තයට අනුව රන් රිදී භාණ්ඩ නිෂ්පාදනය. ..............................

19 දාගැබක සෞන්දර්යාත්මක අගය වැඩි කිරීමට සිදු කළ නිර්මාණය. ..............................

20 පොළොන්නරුවේ පිහිටි පිළිමගෙයකි. ..............................

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.**

01. (1) අනුරාධපුර හා පොළොන්නරු යුගයන්ට අයත්වන සාම්ප්‍රදායික තාක්ෂණය ආශ්‍රිත නිර්මාණ කිහිපයක් මෙහි දක්වා ඇත. ඒවා යුග දෙකට අනුව වෙන වෙනම ලියා දක්වන්න.

| |
|---|
| අභයගිරිය, දෙමළ මහා සෑය, මිරිසවැටිය, දැදිගම කොටවෙහෙර, කලා වැව, පරාක්‍රම සමුද්‍රය, නෙළුම් පොකුණ, රන් මසු උයන, ජේතවන දාගැබ, රන්කොත් වෙහෙර |

| | අනුරාධපුර යුගය | | පොළොන්නරු යුගය |
|---|---|---|---|
| 1. | .................................................. | 1. | .................................................. |
| 2. | .................................................. | 2. | .................................................. |
| 3. | .................................................. | 3. | .................................................. |
| 4. | .................................................. | 4. | .................................................. |
| 5. | .................................................. | 5. | .................................................. |

(2) අතීත පිළිම ගෙවල් නිර්මාණය කල ප්‍රධාන සම්ප්‍රදායන් 03 දක්වන්න. (ල. 3)

(3) පැරැන්නන් පිළිම ගෙවල් නිර්මාණය කිරීමේ ප්‍රයෝජන 03 ක් දක්වන්න. (ල. 3)

(ල. 10)

02. (1) අතීතයේ ශ්‍රී ලාංකිකයන් වැව් තැනීමේදී මුහුණ දුන් අභියෝග තුනක් දක්වන්න. (ල. 3)

(2) පහත දැක්වෙන්නේ වැවකින් කෙරෙන කාර්යයන් කිහිපයකි. ඒවා වැවක කුමන අංගයක් මගින් සිදු කෙරෙන්නේ දැයි දක්වන්න.

A - වැව් ජලය මනා පාලනයකින් යුතුව පිටතට ගැනීම.

B - වැවේ ජලය නිම්නයට මුදා හැරීම.

C - වැවක අතිරික්ත ජලය පිට කිරීම.

D - වැව් බැම්ම සේදී යාම වැළැක්වීම. (ල. 4)

(3) පැරණි ජල තාක්ෂණය අනුව ඇළ හා වේලි තාක්ෂණය විශේෂ වේ. වේලි ඉදිකිරීමේ තාක්‍ෂණය ආශ්‍රිත කරුණු 02 ක් දක්වන්න. (ල. 4)

03. (1) කෘෂිකර්මය සඳහා ජලය ගෙනයාමේ ඇළ මාර්ග තාක්‍ෂණය ආශ්‍රිතව පහත සඳහන් තොරතුරු ඇසුරින් පිළිතුරු සපයන්න. (යෝධ ඇල, ඇලහැර ඇල, මිණිපේ ඇල, තලවතු ඇල)

A - මින්නේරිය වැවට ජලය ලබා ගැනීමට ඉදිකළ ඇළ

B - දිග සැතපුම් 54 ක් වන විශිෂ්ට බිම් මැණුම් ක්‍රම මත ඉදිකළ ඇළ මාර්ගය

C - ජල ධාරිතාව වැඩිවන විට ඉවුරු සේදී යාම වැළැක්වීම සඳහා දිය පහරවල් එක්වන ස්ථාන ගල් බැමි යොදා ශක්තිමත් කළ ඇළ මාර්ගය.

D - මහවැලි ගඟේ සිට උතුරට ජලය ගෙන යාමට තැනූ ඇළ මාර්ගය. (ල. 4)

(2)



i. මිනිසාගේ විවිධ අවශ්‍යතාවන් ඉටු කර ගැනිමට ජලය එක් රැස් කර තබා ගැනීමට ඉදිකළ පොකුණක රූපයක් මෙහි දක්වා ඇත. එය නම් කර පිහිටි ස්ථානය දක්වන්න. (ල. 4)

ii. ඔබ ඉහත දැක්වූ පොකුණ මගින් ඉටු වූ අරමුණු තුනක් දක්වන්න. (ල. 3)

04. පැරණි ජල තාක්ෂණය ආශ්‍රිත තොරතුරු ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

(1)

| පිහිටීම | නිර්මාණයේ නම | ප්‍රයෝජනය |
|---|---|---|
| අභය ගිරිය | 1. ...................................... | ස්නානය |
| 2. .................................... | කුමාර පොකුණ | 3. ......................................... |
| අනුරාධපුරය | 4. ..................................... | පරිසරය සිසිල්ව තබා ගැනීම |
| 5. ...................................... | කලා වැව | 6. ...................................... |

(ල. 6)

(2) අතීත මිනිසා මැටි භාණ්ඩ තැනීමේ විප්ලවයක් ඇති වූයේ කුමක් සොයා ගැනීමෙන් පසුව ද? (ල. 2)

(3) මැටි භාණ්ඩ තැනීමේ තාක්ෂණය ආශ්‍රිත කරුණු 3 ක් දක්වන්න. (ල. 3)


05. දී ඇති උපකාරක පද ඇසුරින් ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.

<u>පහළට</u>

1. එකිනෙකට ආසන්නව ඉදිකළ පොකුණු 40 ක් හමුවූ ස්ථානය
2. දුටුගැමුණු රජු නිමකළ දාගැබකි
3. මෙරට බුදු දහම ස්ථාපනයට මූලික වූ හිමි නමකි.
4. සීගිරියේ මෙවැනි දෑ බොහෝය.
5. අතීතයේ යකඩ නිස්සාරණය කළ බවට සාක්ෂි ඇති ස්ථානයකි
6. පොළොන්නරුවේ ලංකා තිලකය හා තිවංක පිළිමගෙය මෙම පිළිම ගෙවල් සම්ප්‍රදායට ඉදිකර ඇත.

<u>හරහට</u>

1. කණ්ඨක චෛතිය මෙහි පිහිටා ඇත.
2. උද්‍යාන පාලකයින් මේ නමින් හඳුන්වා ඇත.
3. අනුරාධපුරයේ ජල ක්‍රීඩාවට හා ස්නානයට යොදාගත් පොකුණු මෙහි පිහිටා ඇත.
4. දාගැබක පිහිටි ප්‍රධාන අංගයකි.
5. කුඩා දාගැබ් ආවරණයට තිබූ නිර්මාණයකි.




06. (1) මෙහි A, B හා C වලින් දක්වෙන නිර්මාණ නම් කරන්න. (ල. 3)

(2) A රූපයෙහි දක්වෙන නිර්මාණයෙහි පවතින ලක්ෂණ 03 ක් දක්වන්න. (ල. 3)

(3) පැරණි කැටයම් හා මූර්ති කලාව ආශ්‍රිතව ඉහත නිර්මාණ වලට අමතරව පාෂාණ හා ලෝහ භාවිතයෙන් කරන ලද නිර්මාණ 03 ක් දක්වන්න. (ල. 3)

(4) මුල් යුගයේ සිටම ලංකාවේ චිත්‍ර කලාව පැවති බවට සාක්ෂි පවතින ස්ථාන 02ක් මෙම ස්ථාන අතුරින් තෝරා ලියන්න. (ල. 2)




| හිඳගල, අනුරාධපුරය, දඹුල්ල, කොළඹ, සිතුල්පව්ව, ත්‍රිකුණාමලය, නල්ලූර්, වෙස්සගිරිය |
|---|

07. (1)



1 රූපය



2 රූපය

1. අංක 1 හා 2 රූප වල අඩංගු නිර්මාණ දෙක නම් කරන්න. (ල. 4)
2. අංක 1 නිර්මාණය පිහිටා තිබෙන්නේ කුමන රාජධානියකට අයත් ප්‍රදේශයක ද? (ල. 2)
3. එහි විශේෂ ලක්ෂණ 1 ක් දක්වන්න. (ල. 2)
4. අංක 2 රූපයේ ඇති ස්ථානය තුලින් ප්‍රයෝජන 02 ක් දක්වන්න. (ල. 3)

## පිළිතුරු පත්‍රය - I කොටස

01. වියළි 02. සාරවත් නැති බව 03. පොළොන්නරුවේ 04. තිසා 05. ගංවතුර 06. ( ✓ ) 07. ( ✗ )
08. ( ✓ ) 09. ( ✓ ) 10. ( ✗ ) 11. ( 3 ) 12. (4 ) 13. ( 2 ) 14. ( 4 ) 15. ( 2 )
16. (C) 17. (B) 18. (E) 19. (A) 20. (D)

(2 x 20 = ල. 40)

## II කොටස


01. (1) අනුරපුර - අභයගිරිය, මිරිස වැටිය, කලාවැව, නෙළුම් පොකුණ, රන් මසු උයන, ජේතවන දා ගැබ
පොළොන්නරුව - දෙමළ මහා සෑය, දැදිගම කොටවෙහෙර, පරාක්‍රම සමුද්‍රය, රන්කොත් වෙහෙර (ල. 10)
(2) ගන්ධ කුටි, ගෙඩිගේ, ලෙන් විහාර,(ල. 3)
(3) බුදුපිළිම තැන්පත් කිරීමට, අව් වැසි වලින් අරක්‍ෂා වීමට, වන්දනාමානයට (ල. 3)

02. (1) ● ආරක්ෂිතව වැව් බැම්ම ඉදිකිරීම, ● අවශ්‍ය ශ්‍රමය සපයා ගැනීම, ● වැව් ඉදිකරන ස්ථානය - ආදිය.... (ල. 3)
(2) A - බිසෝ කොටුව B - සොරොව්ව C - පිටවාන
D - රළපනාව (ල. 4)
(3) ⋆ අමුණක් / වේල්ලක් බැඳීමට දිය පාර වල් හරස් කරයි. ⋆ විශාල ගල් කුට්ටි මගින් වේලි බැඳීම. ⋆ වේල්ලේ අත්තිවාරම පිහිටි ගලට සම්බන්ධ කිරීම ආදිය...... (ල. 4)

03. (1) A - තල්වතු ඇළ B - යෝධ ඇළ / ජය ගඟ C - ඇළහැර ඇළ
D - මිණිපේ ඇළ (ල. 4)
(2) කුට්ටම් පොකුණ, අනුරාධපුරය (ල. 4)
(3) අභයගිරි භික්ෂූන්ගේ ජල පරිභෝජනය, අලංකාරය, පරිසරය සිසිල්ව තබා ගැනීම. (ල. 3)

04 (1) 1. ඇත් පොකුණ 2. පොළොන්නරුව 3. අලංකාරය
4. කුට්ටම් පොකුණ 5. අනුරාධපුරය 6. ජලය රැස් කර තබා ගැනීම (ල. 6)
(2) සකපෝරුව (ල. 2)
(3) බඳුනේ වර්ණ ගැන්වීම, පින්තාරු කිරීම, භාජන මත මෝස්තර රටා ඇඳීම, විවිධ හැඩයේ වැව් බැම්ම තැනීම.(ල. 3)

05.




(ල. 11)

06. (1) A - සඳකඩ පහන් B - මුරගල C - කොරවක්ගල (ල. 3)
(2) ● පොළොන්නරු අවධියේ දී ගවයා ඉවත්වීම ● ගොඩනැගිලි ප්‍රවේශ දොරටු ඉදිරියේ සකස් කර ඇත.
● ලියවැල් රවුම, නෙළුම් පොහොට්ටුවක් තුඩින් ගත් හංස පේළිය (ල. 3)
(3) ⋆ බෞද්ධ හා හින්දු මූර්ති ⋆ ගලින් කළ බුද්ධ ප්‍රතිමා ⋆ ලෝකඩ මූර්ති ආදිය..... (ල. 3)
(4) හිඳගල, සිතුල් පව්ව, වෙස්සගිරිය (ල. 2)

07. (1) 1. නෙළුම් පොකුණ 2. කුට්ටම් පොකුණේ ජල පෙරණය (ල. 4)
(2) පොළොන්නරුව
(3) ● අලංකාරය පිණිස තනා ඇත. ● කවාකාර ගල් පතුරු යොදා සකස් කර ඇත. ● ගල් පුවරු එකිනෙක සම්බන්ධ කර ඇත. (ල. 2)
(4) ● රොන්මඩ තැන්පත් වීම, ● පොකුණට මඩ ගලා නොයාම ● අපද්‍රව්‍ය පොකුණට එකතු වීම වැළැක්වීම (ල. 3)